**බස්නාහිර පළාත් අධ්‍යාපන දෙපාර්තමේන්තුව**
**සිංහල භාෂාව හා සාහිත්‍ය තරගාවලිය - 2024**
**(කලාප මට්ටමේ ලිඛිත තරග)**

1. අපේක්ෂකයාගේ නම : ..............................
   (මුල්'කුරු සමඟ නිවැරදිව ලියන්න.)
2. විදුහලේ නම සහ ලිපිනය : ..............................
3. පාසල් වර්ගය (200 තෙක්/ 201 - 500 තෙක්/ 500 ට වැඩි) ..............................
4. කලාපය : ..............................
5. පළාත : ..............................

| **10 ශ්‍රේණිය** | **පද්‍ය නිර්මාණ හා අවබෝධය** | **කාලය පැය 02** |
|---|---|---|

- පළමුවන කොටසට අයත් **සියලු ම ප්‍රශ්නවලට** පිළිතුරු සපයන්න.
- දෙවන කොටසේ (අ), (ආ) ප්‍රශ්න දෙකෙන් **එක් ප්‍රශ්නයකට පමණක්** පිළිතුරු සපයන්න.
- ඔබගේ පිළිතුරු පත්‍රය සමග ප්‍රශ්න පත්‍රය ද අමුණා එවිය යුතු ය.

## I - කොටස

(01) පහත දැක්වෙන ඡේද ඇසුරින් අසා ඇති ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.

(අ) මාත්‍රාවක් නම් මුවින් නිකුත් කළ හැකි ඉතා කෙටි ශබ්දයේ දිග ප්‍රමාණයයි. වෙනත් ලෙසකින් කිවහොත් ඇසි පිය ගැසුමකට ගත වන කාලයයි. එබඳු එක් මාත්‍රාවක් ඇත්තේ ලඝු නම්. ම, ල වැනි හ්‍රස්වාක්ෂර නිදර්ශනයි. මාත්‍රා දෙකක් ඇත්තේ ගුරු නම්. මා, ලා, වැනි දීර්ඝාක්ෂර නිදර්ශනයි. ම්, ල් වැනි ගාත්‍රාක්ෂරවල ප්‍රමාණය අර්ධ මාත්‍රාවකි.

ඒ අනුව බලන විට ම, ල (ම් + අ, ල් + අ) යන තන්හි මාත්‍රා එක හමාරක් ඇතත් කාව්‍ය ශාස්ත්‍රයේ දී ඒවා ද ගනු ලබනුයේ ලඝු මාත්‍රා හැටියට ය. එහෙත් ලඝු අක්ෂරයකින් පරව ගාත්‍රාක්ෂරයක් පිහිටීමෙන් සෑදෙන මල්, තල් යනාදිය ගුරු මාත්‍රා හැටියට සලකනු ලැබේ.

ලඝු මාත්‍රාව කෙටි සෘජු රේඛාවකින් ද (-) ගුරු මාත්‍රාව වක්‍ර රේඛාවකින් ද (⌣) ලකුණු කරනු ලැබේ. ඒ අනුව 'අහර කුක්කා' යන වචනයෙහි ලඝු ගුරු මාත්‍රා ලකුණු කළ යුත්තේ මෙසේය෴

අහර = ___ ___ ___
කුක්කා = ⌣ ⌣

i. මාත්‍රාවක් යනු කුමක් ද?
ii. මාත්‍රා දෙකක් ඇතිවිට එය හඳුන්වන්නේ කවර නමකින් ද?
iii. මාත්‍රා එකහමාරක් වුවත් කාව්‍ය ශාස්ත්‍රයේදී ඒවා ගැනෙන්නේ කවර ලෙසකට ද?
vi. ලඝු මාත්‍රාවක් හා ගුරු මාත්‍රාවක් ලකුණු කරන අයුරු දක්වන්න.
v. 'මහර නැන්දා' යන වචනයේ ලඝු ගුරු මාත්‍රා ලකුණු කර පෙන්වන්න.

(ලකුණු 1 X 5 = 5)

(ආ) සිංහල පද්‍යය මුල සිට ම පාහේ හැඩ ගැසුණේ සියබස්ලකරින් දෙන ලද අවවාද, අනුශාසනා අනුවය. ඉන් හුවා දක්වන ලද අලංකාරවාදය එය පහළ වීමට පෙරදී පවා මෙරට කවීන් දැන සිටි බව සීගිරි පද්‍යාවලින් හෙළි වෙයි. එසේම සියබස්ලකරට පෙර ද සිංහල ඡන්දෝග්‍රන්ථ මෙරට පැවති බව, ''පොරණ ඇජරන් ගිය ඇලුප් මගින්'' යනුවෙන් එළු සඳැස් ලකුණේ එන පාඨයෙන් හැඟේ. එවැනි සිංහල ඡන්දෝග්‍රන්ථයක් තිබුණ බව

''කලා ගුරු සුලු පා - වැසි වූ කුලුණු නුවන යුත්
කලන මිනෙ වියතුන් - ගත් හි පියුම් ලකුණු ඈ''

යනුවෙන් සියබස්ලකර කතුතුමා ද පැවසී ය. මේ කියන ඡන්දෝලංකාර ග්‍රන්ථ මොනවාදැයි නිසැක ලෙස කිව නොහැකි ය. සමහර විට සංස්කෘත කාව්‍යාලංකාර ම ඒවායින් ද විස්තර වන්නට ඇත. එසේම එවකට ප්‍රචලිතව පැවැති දේශීය කාව්‍ය සම්ප්‍රදායක් පදනම් කර ගත් අලංකාර ග්‍රන්ථ ද ඒ අතර තිබුණා විය හැකි ය.

i. සිංහල පද්‍යයට මුල සිට ම අවවාද අනුශාසනා සැපයූ කෘතිය කුමක් ද?
ii. එහි දැක්වෙන අලංකාරවාදය මෙරට කවීන් මුල සිට ම දැනගෙන සිටි බවට තොරතුරු හෙළි වන්නේ කවර පද්‍ය ඇසුරින් ද?
iii. ''පොරණ ඇජරන් ගිය ඇලුප් මගින'' යන පාඨයෙන් හැඟවෙන්නේ කුමක් ද?
vi. එවක පැවැතෙන්නට ඇතැයි සැලසෙන අලංකාර ග්‍රන්ථ පදනම් කොටගෙන මේ කතුවරයා එළඹෙන අනුමානය කුමක් ද?
v. පාඨයේ දැක්වෙන සිංහල ඡන්දෝග්‍රන්ථයේ නම කුමක් ද? **(ලකුණු 1 X 5 = 5)**

(02) පද පූරණය කොට ලියන්න.

i. කැවුම් කොකිස් මුං අළුවා සුවඳ දැනෙන්නයි
ලිපේ ඉදෙන කිරිබත් රස ගමට බෙදන්නයි
........................................................................................
........................................................................................

ii. ........................................................................................
........................................................................................
දෙපා නැමැද සමුගම්
ලොවම දිනා යළි එම්

iii. සරුංගලේ රැලි සුළඟෙ නටනවා
........................................................................................
........................................................................................
ඇතක ඉගිළී යන්න හදනවා

iv. අඳුර නැගෙද්දී සඳ පායද්දී ඉර කොහි හැංගෙන්නේ
තරු හිනැහෙද්දී පිනි දැවටෙද්දී ගත සිසිලස වෙන්නේ
........................................................................................
........................................................................................

v. රැන් පිටින් සමනලයින් සිරිපා වැද ඉගිලෙනකොට
..................................................................................................
..................................................................................................
හීන් සැරෙන් හිත දිව්වා හීතල පිරි ගිරි සිරසට

(ලකුණු 2 x 5 = 10)

(03) පහත දැක්වෙන කවි පැනවලට අදාළ විරිතින් ම පිළිතුරු සපයන්න.

i. පිහිනා ගිහින් නෙක පැහැසර මල් නෙළුව
පතුළට කිමිද නොසිතපු තැනෙකින් මතුව
කරණම් ගසා දියමත සුරුකම් කෙරුව
මතකද එදා කළ කෙළි කම් රස ඇතුව?

ii. දුර ඈත කඳුවල
දැවටී සුවඳ මදනල
කුරුළු නද එක්කල
රසය මැව්වේ කවුද ලොව තුළ?

iii. ගැමුණු රජුන් රුවන්වැලිය වෙහෙර හදන කාලේ
ගඩොල් අතින් අත යවමින් දුවපැන වැලි මාලේ
අප සතුටින් හිටි හැටි සිහිපත් කර ඒ බාලේ
ලියනවාද රස කවියක් මතක හිටින තාලේ?

iv. අම්මා තාත්තා ගෙයි නැති වෙලාව ට
අමුතු යානයක් විත් ඔබගේ ළඟට
ඇරයුම් කළොත් යන්නට දුර සක්වළ ට
කුමක් කරන්නෙ ද රහසේ කියන් ම ට?

v. අගේ කරල කඳු මුදුනින් පනින්නේ
නොනැවතීම ගඟ පහළට ගලන්නේ
වගේ වගක් නෑ වැස්සට පිරෙන්නේ
හැඩ මවමින් කොහේටදෝ ගලන්නේ?

(ලකුණු 2 x 5 = 10)

(04) (අ) පහත දැක්වෙන ප්‍රශ්නවලට කෙටි පිළිතුරු සපයන්න.

(i) සැලළිහිණි සන්දේශයේ දැකිය හැකි ප්‍රකට කාව්‍ය විරිතක් නම් කරන්න.
..................................................................................................

(ii) 'අනුප්‍රාසය' යන්න කෙටියෙන් හඳුන්වන්න.
..................................................................................................

(iii) ''වැඳ රද පද කමල'' යන පද්‍ය පාදයේ එන කාව්‍යාලංකාරය කුමක් ද?
..................................................................................................

(iv) පෙරදිග කාව්‍ය විචාරකයන්ට අනුව කවියෙකු වීමට බලපාන හේතුවක් දක්වන්න.
..................................................................................................

(ලකුණු 1 x 4 = 4)

(ආ) මෙම කවි පදවල මාත්‍රා සංඛ්‍යාව ඉදිරියෙන් ඇති කොටුවේ ලියන්න.


(i) මහලු අයට සරදම් නොකරන්නේ
විහිළු කමට ගල්මල් නොගසන්නේ

(ii) සග සිරි අසා ලා
කළ යුරු සොඳුරු සාලා

(iii) අඹ, දඹ, පේර, වැළ, වරකා, අන්නාසි
රඹුටන්, දිවුල්, බෙලි, මොර තුරු අගරාසි

(ලකුණු 2 X 3 = 6)

(05) පහත දැක්වෙන චිත්‍රය මැනවින් නිරීක්ෂණය කොට කැමති විරිතකින් කාව්‍ය නිර්මාණයක් කරන්න. සුදුසු මාතෘකාවක් ද යොදන්න. (සඳැස් නම් පද්‍ය 6 - 8 අතර විය යුතු ය. නිසඳැස්/ නිදහස් නිර්මාණයක් නම් පේළි 25 - 30 අතර විය යුතුයි.)



(ලකුණු 10)

(මුළු ලකුණු 50)

## II - කොටස

- (අ) කොටසින් හෝ (ආ) කොටසින් **කැමති ප්‍රශ්නයක්** තෝරා ගෙන කාව්‍ය නිර්මාණයක් කරන්න.
- සඳැස් පද්‍ය පන්තියක් නම් කවි 6 - 8ක් විය යුතු ය.
- නිසඳැස් පද්‍ය පන්තියක් නම් පේළි 25 - 30 ක් අතර විය යුතු ය.

### (අ) කොටස

i. මහ දුරු රටක තනි වී හිඳ
දහසක් දුක් විඳිනා සඳ
ඔබ හෙළනා සුසුමින් අද
රිදුම් දිදී හඬවයි හද (මාතෘකාව - දුරු රටකට ගිය මවුනී)

ii. ජල බිය ගිනි බිය නොමදෙන
ලොවට උතුම් නිරතුරුවම
සුන්දර සිරිලක අසිරිය
සුරකිමි එය මට අගේය (මාතෘකාව - සුන්දර සිරි ලංකා)

(ලකුණු 50)

### (ආ) කොටස

i. ගොවියෝ කුඹුරෙන් ගොඩට විත් ඇලට බැස මඩ සෝදා ගෙන ලියද්ද අසබඩ මීටියාවතේ නිල් තණ පියස මත වාඩි ගත්හ. ඇඹුල ගෙනා ගෙවිලියෝ කෙසෙල් පත්වලට ඇඹුල බෙදන්නට වූහ. කුඹුරක සිදුවන මෙවැනි සිදුවීම් කවි පෙළකින් ලියන්න.

ii. ඔබ දන්නා ජන කතාවක් හෝ ජාතක කතාවක් ඇසුරු කර ගනිමින් කවි කතාවක් නිර්මාණය කරන්න.

(ලකුණු 50)

(මුළු ලකුණු 100)